**අධ්‍යාපන අමාත්‍යාංශය - තාක්ෂණ අධ්‍යාපන ශාඛාව,**

**28 ගෘහ ආර්ථික විද්‍යාව**

**2024 අ.පො.ස(උසස් පෙළ) - පෙරහුරු ප්‍රශ්න පත්‍රය**

**කාලය පැය 02**

## I - පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා එය පිළිපදින්න.**
- **1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) , (2) ,(3) , (4) , (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි (×) යොදා දක්වන්න.**

---

01. විවිධ ආකාරයේ රේඛා මගින් ඇති කරන හැඟීම් විවිධ වේ.ඒ අනුව තිරස් රේඛා මගින් ඇති කරන හැඟීම් වනුයේ,

1. උස්බව, සෘජුබව සහ ගෞරවනීය බවයි.
2. තැන්පත් බව, මිටි බව සහ කෝමල බවයි.
3. කලබලකාරි බව, ශාන්ත බව සහ මිටි බවයි.
4. තැන්පත් බව, පුළුල් බව සහ ශාන්ත බවයි.
5. ක්‍රියාශීලී බව, චලනය සහ ශාන්ත බවයි.

02 . ප්‍රශස්ත ජීවන පරිසරයක් නිර්මාණයේ දී භෞතික පරිසරය මෙන් ම අවධානය යොමු කළ යුතු පරිසරය වනුයේ,

1. ග්‍රාමීය පරිසරය ය.
2. නාගරික පරිසරය ය .
3. සමාජ පරිසරය ය .
4. සුමට භූ දර්ශන පරිසරය ය.
5. දෘඪ භූ දර්ශන සහිත පරිසරය ය.

03. පරිසරයට කාබන් මුදා හැරීම, ජල භාවිතය, ශක්ති පරිභෝජනය හා මුදාහරින අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමෙන් ඉදිකරන ගොඩනැගිලි හඳුන්වන්නේ,

1. නූතන සංකල්පයේ ගොඩනැගිලි ලෙසිනි.
2. පශ්චාත් නූතන සංකල්පයේ ගොඩනැගිලි ලෙසිනි.
3. අනුකූලත්වයට අනුව ඉදි වූ ගොඩනැගිලි ලෙසිනි.
4. හරිත සංකල්පයට අනුව ඉදි වූ ගොඩනැගිලි ලෙසිනි.
5. සන්දර්භය යටතේ ඉදි වූ ගොඩනැගිලි ලෙසිනි.

04. ගොඩනැගිලි නිර්මාණය සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

a) වහලය හා සිවිලිම සඳහා තාප පරිවාරක ද්‍රව්‍ය යෙදීම වඩාත් සුදුසු ය.
b) ගොඩනැගිල්ලේ උතුරු පැත්තට හා දකුණු පැත්තට ඝනකම අඩු බිත්ති යොදා ගැනීම සුදුසු නොවේ.
c) සුදු පැහැ පොළොව අවකාශයේ ප්‍රමාණය හකුළුවා දක්වන අතර තදපැහැ පොළොව අවකාශයේ ප්‍රමාණය විශාල කර දක්වයි.
d) කෘත්‍රිම ආලෝකය හැකි තරම් අවම ප්‍රමාණයක් යොදා ගත යුතුය.
e) ආලෝකය ලබා ගැනීම පිණිස ජනේලවලට භාවිත කර ඇති වීදුරු වර්ග හා බිත්ති වල වර්ණය කාමරයේ විශාලත්වය කෙරෙහි බලපෑමක් ඇති කරයි.

මින් **නිවැරදි** ප්‍රකාශය වන්නේ,

1).a ,b සහ c ය .
2). a ,d සහ e ය .
3). b ,c සහ e ය
4).b ,d සහ e ය .
5). a ,c සහ d ය .

5. ආහාරයක සංයුතියෙහි හයිඩ්‍රජන් හා ඔක්සිජන් අතර අනුපාතය 2:1 වන්නේ,

1).මේදවල ය . 2).ප්‍රෝටීන් හා මේදවල ය . 3).කාබෝහයිඩ්‍රේටවල ය .
4).ප්‍රෝටීන්වල ය . 5).කාබෝහයිඩ්‍රේට හා මේදවල ය .

6. විටමින් B කාණ්ඩයට අයත් ෆෝලික් අම්ලය සහ ඇවිඩීන් හඳුන්වනුයේ පිළිවෙලින්,

1. විටමින් $B_1$ සහ $B_2$ ලෙස ය.
2. විටමින් $B_8$ සහ $B_{12}$ ලෙස ය.
3. විටමින් $B_7$ සහ $B_{11}$ ලෙස ය.
4. විටමින් $B_6$ සහ $B_3$ ලෙස ය.
5. විටමින් $B_9$ සහ $B_4$ ලෙස ය.

7. අත්‍යාවශ්‍ය සහ අත්‍යාවශ්‍ය නොවන ඇමයිනෝ අම්ල **දෙකක්** පිළිවෙලින් දක්වා ඇති පිළිතුර කුමක්ද?

1. ආජිනීන් සහ ලියුසීන් 2.හිස්ටිඩීන් සහ වැලීන් 3.ලියුසීන් සහ සිස්ටීන්
4. තයිරොසීන් සහ වැලීන් 5. ට්‍රිප්ටොපැන් සහ මෙතියොනීන්

8. විටමින් A ඌනතාව නිසා මිනිසා තුළ පිළිබිඹු කරනු ලබන ඌනතා රෝග **දෙකක්** වනුයේ,

1. බිටෝල්ප සහ ගලගණ්ඩය ය
2. රිකට්සියාව සහ ස්කර්වි ය
3. ඔස්ටියෝමැලේෂියාව සහ කෙරෙටොමැලේෂියාව ය
4. අස්ථි ක්ෂීණතාව සහ අස්ථි මාර්දව ය
5. සෙරොප්තැල්මියාව සහ කෙරෙටොමැලේෂියාව ය

9.ආහාර පිසීමේදී භාවිත වන මෘදු කාරකයක් සහ උකු කාරකයක් පිළිවෙලින් දැක්වෙන වරණය කුමක්ද?

1.සියඹලා සහ අමු ගස්ලබු 2.හාල්පිටි සහ පොල් කිරි 3.ගොරකා සහ විනාකිරි
4.සීනි සහ ගොරකා 5.අමු ගස්ලබු සහ හාල්පිටි

10.මානව ජීවන චක්‍රය තුළ පෝෂණ අවශ්‍යතා වැඩිම අවධි දෙකක් දැක්වෙන පිළිතුර කුමක්ද?

1.ගර්භණී සහ ක්ෂිරණ අවධිය 2. ළදරු සහ ළමා අවධි 3.මහළු සහ වැඩිහිටි අවධිය

4.ක්ෂීරණ සහ ළදරු අවධිය 5.නවයොවුන් අවධිය සහ ගර්භණී අවධිය

11.පෙක්ටීන් බහුල ආහාර ද්‍රව්‍ය අඩංගු වරණය තෝරන්න.

1. දෙළුම්, පේර, සහ බෙලි
2. දිවුල්, සැපතිල්ලා සහ අන්නාසි
3. අන්නාසි, දෙළුම් සහ බෙලි
4. පේර, දිවුල් සහ සැපතිල්ලා
5. බෙලි, අන්නාසි සහ කෙසෙල්

12.පහත සඳහන් ප්‍රකාශ අතරෙන් **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. සයනොකොබැලමීන් අඩංගු ආහාර ලෙස මස්, මාළු හා කෙසෙල් නම් කළ හැකි ය.
2. මාංශමය ආහාර මගින් හීම් යකඩ ලබා දෙයි.
3. ආහාර රසකාරකයක් වන ගොරකාවල ටාටරික් අම්ලය අඩංගු වේ.
4. නිවුඩු සහල්වල අඩංගු ෆයිටික් අම්ලය මගින් අයඩින් හා පොටෑසියම් අවශෝෂණයට බාධා ඇති වේ.
5. ප්‍රතිඔක්සිකාරක ලෙස ක්‍රියාකරන විටමින් ලෙස A, E හා B නම් කළ හැකිය.

13.හෘදයාබාධ වැළැක්වීමට ගතයුතු වඩාත් **සුදුසු** ආහාර වන්නේ,

1. බිත්තර සුදුමද හා නිවුඩු හාලේ බත් ය.
2. සම්බා හාලේ බත් හා හාල් පිටි ඉඳි ආප්ප ය.
3. බටර් ගාන ලද පාන් හා අලුත් මාළු ය.
4. මේද සහිත කිරි හා බිත්තර සුදු මද ය.
5. සියලු පලතුරු හා බදින ලද කුකුළු මස් ය.

14.පහත දැක්වෙන්නේ රෝග ලක්ෂණ කීපයකි.

- දෙපාවල සංවේදිතාව අඩු වීම
- ඇසේ දෘෂ්ඨි විතානයට හානි වීම
- වකුගඩු අකර්මන්‍ය වීම
- ආඝාතය ඇතිවීම

ඉහත සංකුලතා පෙන්නුම් කරන රෝගය වන්නේ,

1).හෘදයාබාධය ය. 2).දියවැඩියාව ය. 3).ස්ථූලතාව ය.
4).අධිරුධිර පීඩනය ය. 5). ආමාශයික ප්‍රදාහය ය.

15. පිෂ්ඨය ජෙලටිනීකරණය සිදුවන අවස්ථාවක් වන්නේ,

1).බතල තැම්බීමේ දී ය. 2).කැරමල් පුඩින් සෑදීමේ දී ය. 3).බිත්තර සුදුමද ගැසීමේ දී ය.
4).අඹ ජෑම් සෑදීමේ දී ය. 5). වම්බටු මෝජු සෑදීමේ දී ය.

16. ගැඹුරු තෙලේ බැදීමට යෝග්‍ය තෙල් වර්ගයක් වන්නේ,

1).සූරියකාන්ත තෙල් ය. 2).එළවළු තෙල් ය. 3).පොල් තෙල් ය.
4).තල තෙල් ය. 5).සෝයා තෙල් ය.

17. ෂූ පේස්ට්‍රිය ආශ්‍රිතව සකස් කරන සුළු කෑම වර්ග වනුයේ

1. හොට් ඩෝග්, ක්‍රීම් බනිස් හා පැටිස් ය.
2. ක්‍රීම් බනිස්, ප්‍රොපිටරෝල්ස් හා ඉක්ලෙයාස් ය.
3. පේස්ට්‍රි බාස්කට්, පැටිස් හා ක්‍රීම් බනිස් ය.
4. මාළු පාන්, බර්ගර්, හා හොට්ඩෝග් ය.
5. ප්‍රොපිටරෝල්ස්, ඉක්ලෙයාස් හා පෙස්ට්‍රි බාස්කට් ය.

18. ක්ෂුද්‍ර තරංග මගින් හා ගැඹුරු තෙලේ ආහාර පිසීමේදි සිදුවන තාප සංක්‍රාමණ ක්‍රම වන්නේ පිළිවෙළින්

1).සන්නයනය සහ විකිරණය යි. 2).විකිරණය සහ සන්නයනය යි.
3). සංවහනය සහ සන්නයනය යි. 4).සන්නයනය සහ සංවහනය යි
5).විකිරණය සහ සංවහනය යි.

19.ප්‍රතිව්‍යුහගත කරන ලද පිෂ්ඨය අඩංගු ආහාර ද්‍රව්‍ය වන්නේ,

1).තිරිඟු පිටි හා කිතුල් පැණි ය. 2).හබල පෙති සහ ජෑම් ය.
3).රුලං හා හබල පෙති ය. 4).සම්බා සහල් සහ රුලං ය.
5).ජෑම් සහ ජෙලි ය.

20.ආහාර පරිරක්ෂණ ක්‍රමයකදී පහත දැක්වෙන ප්‍රතිඵල ලැබේ.

- ආහාරයේ අඩංගු වර්ණය නොවෙනස් වේ.
- ආහාරයේ අඩංගු එන්සයිම අක්‍රිය වේ.
- ආහාරයේ මතුපිට පෘෂ්ඨයේ ඇති ක්ෂුද්‍ර ජීවීන් පාලනය වේ.

ඉහත දක්වා ඇති ආහාර පරිරක්ෂණ ක්‍රම ශිල්පය වන්නේ,

1).ජීවාණුහරණය යි. 2).පැස්ටරීකරණය යි. 3).උණු තාප ක්‍රමය යි.
4).උපරිතාප ක්‍රමය යි. 5). සුබ්‍රිකරණය යි.

21.මලබද්ධයෙන් පෙළෙන කාන්තාවකට **වඩාත්ම** සුදුසු දිවා ආහාර වේලකි,

1. සම්බා සහලේ බත්, මාළු ඇඹුල්තියල්, කැකිරි ව්‍යංජනය සහ අළුකෙසෙල් ව්‍යංජනය
2. නාඩු සහලේ බත්, මුං ඇට ව්‍යංජනය, කතුරුමුරුංගා කොළ තෙම්පරාදුව සහ වම්බටු මෝජුව
3. නාඩු සහලේ බත්, මාළු මිරිසට, වැටකොළු ව්‍යංජනය සහ කතුරුමුරුංගා කොළ මැල්ලුම
4. සම්බා සහලේ බත් , කුකුළු මස් ව්‍යංජනය, අල බැදුම සහ බෝංචි තෙම්පරාදුව
5. කැකුළු සහලේ බත්, හාල්මැස්සන් බැදුම, අල බැදුම හා කැරට් සම්බලය

22. පහත සඳහන් ප්‍රකාශ අතුරින් **නිරවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

1. රටකජු, බඩඉරිඟු ආදියෙහි සැල්මොනෙල්ලා (Salmonella) බැක්ටීරියාව බෙහෙවින් අඩංගු වේ.
2. ක්ෂුද්‍රජීවී වර්ධනයට බලපාන බාහිර සාධක ලෙස ආහාරයේ අඩංගු පෝෂ්‍ය ද්‍රව්‍ය ප්‍රමාණය සහ වායුගෝලීය ඔක්සිජන් බලපානු ලැබේ.
3. කෙසෙල්, නමිනං හා කජු පුහුලන් වැනි පලතුරු දුඹුරු පැහැ වීමට මෙලාඩ් ප්‍රතික්‍රියාව හේතු වේ.
4. ක්ලොස්ට්‍රිඩියම් බොටියුලිනම් ( Clostridium botulinum) නම් බැක්ටීරියාව ආහාරයට එක්වීමෙන් මිනිස් සිරුරට විෂ එකතු වේ.
5. මේද අඩංගු ආහාර මුඩුවීමේ ක්‍රියාවලිය වේගවත් කරන සාධක ලෙස ජලය සහ පෝෂ්‍ය පදාර්ථ දැක්විය හැකිය.

23. නිමි ඇඳුම් කර්මාන්තය පිළිබඳ **නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් පළමුවෙන් අපනයනය කරන ලද්දේ යුරෝපීය රටවලට ය.
2. 1977 වර්ෂයේ ආරම්භ කරන ලද විවෘත ආර්ථික ප්‍රතිපත්තිය, නිමි ඇඳුම් කර්මාන්තයේ ශීඝ්‍ර දියුණුවට හේතු විය.
3. යුරෝපා සංගමයේ රටවල් පමණක් ශ්‍රී ලංකාවේ නිමි ඇඳුම් ආනයනය කරයි.
4. 2020 වර්ෂයේදී නිමි ඇඳුම් අපනයනය කිරීමෙන් ලැබූ ආදායම දළ දේශීය නිෂ්පාදනයෙන් 70% කි.
5. නිමි ඇඳුම් නිෂ්පාදනය සඳහා අවශ්‍ය සියළුම අමුද්‍රව්‍ය හා උපාංග මෙරට නිෂ්පාදනය කරයි.

24. නිමි ඇඳුම් කර්මාන්තශාලාවක් තුළ සිදුකරන ක්‍රියාවලියට අදාළ නොවන පියවරක් වනුයේ,

1).පිරි සැළසුම් නිර්මාණය ය. 2).මාකර් සටහන් තැබීම ය. 3).පතරොම් නිර්මාණය ය.
4).රෙදිවල තත්ත්ව පරික්ෂාව ය. 5).මෝස්තර නිර්මාණය ය.

25. නිමි ඇඳුමක් සඳහා ඇසුරුම් කිරීමට පෙර දෙනු ලබන උසස් නිමාවකි.

1. උණුසුම් තෙරපුමක් ලබා දීම.
2. අවශ්‍ය ස්ථානවලට කඩදාසි යෙදීම.
3. අදාළ ස්ථාන සඳහා විවර පියවීම් යෙදීම.
4. කැපුම් අද්දර නිම කිරීම.
5. ඇඳුමට අදාළ ලේබල් ගැසීම.

26. පහත දක්වා ඇත්තේ කෙඳි වර්ගවලට අදාළ ගුණාංග කීපයකි.

A - ඇදෙන සුළුය
B - සේදීමේදී කෙඳි දුර්වල වේ.
C - පිළිස්සීමේදී පිහාටු පිළිස්සෙන ගන්ධයක් නිකුත් වේ.
D - අම්ල හා ක්ෂාරවලට ප්‍රතික්‍රියා නොදක්වයි.
E - ඩයිවර්ග සඳහා ඉතා ඉහළ ආකර්ශනයක් ඇත.

මේ අතරින් ලෝම කෙඳිවල ගුණාංග දැක්වෙනුයේ

1).A , B සහ C මගිනි. 2). B ,C සහ D මගිනි. 3). C, D සහ E මගිනි.
4).A ,B සහ D මගිනි. 5). B , C සහ E මගිනි.

27. විෂ්කම්භය 118 cmක් වූ රවුම් මේසයක් සඳහා , මේස රෙද්දක් නිර්මාණය කිරීමට අවශ්‍ය රෙදි ප්‍රමාණය වනුයේ,

1.178cm සහ 175cm ය. 2). 178cm සහ 178cm ය. 3).175cm සහ 175cm ය.
4).175cm සහ 178cm ය. 5).178cm සහ 145cm ය.

28. වානිජ මැහුම් වර්ගයක සමාංශක පෙනුම පහත දැක්වේ.




මෙම මැහුම් ක්‍රමය හඳුන්වන්නේ,

1. තනිනූලේ දම්වැල් මැස්ම(single thread chain stitch) ලෙසය.
2. අත් මැස්ම (hand stitch) ලෙසය.
3. නොපෙනෙන මැස්ම(blind stitch) ලෙසය.
4. අගුළු මැස්ම (lock stitch) ලෙසය.
5. වැසුණු දම්වැල් මැස්ම (cover in chain stitch) ලෙසය.

29. රෙදි මතුපිට අලංකාර කිරීමේදී අනුගමනය කරන පියවර කිහිපයක් පහත දැක්වේ.

A. රෙදි සෝදා වියළා ඉස්ත්‍රික්ක කර ගැනීම
B. පිටපත් කරන ලද මෝස්තරය රැලි නොසිටින ලෙස රාමුවට ඇමීම
C. පින්සල භාවිතයෙන් වර්ණ මිශ්‍ර කිරීම
D. පින්සල හෝ ස්පොන්ච් කැබලි භාවිතයෙන් රෙද්දේ වර්ණ ගැන්වීම

මෙම පියවරවලට අදාළ මතුපිට අලංකාර කිරීමේ ක්‍රමය වනුයේ,

.

1.බතික් කිරීමයි. 2.සිදුරු තහඩු මුද්‍රණය යි. 3. රෝලර් මුද්‍රණය යි
4.තිරරාමු මුද්‍රණය යි. 5. පින්තාරු කිරීම යි.

30.කෙටි සාය පතරොම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මිනුම් පහත දැක්වේ.

- ඉණ මිනුම 64 cm
- උකුල මිනුම 91 cm
- උකුල් එල්ලය 19.5 cm
- සාය උස 53 cm

කෙටි සාය පතරොම නිර්මාණය සඳහා අවශ්‍ය රාමුව ගොඩනැගීමේදී ගණනය කළ උකුල් මිනුම වනුයේ

1.32 cm ය. 2.45 cm ය. 3.44.5 cm ය
4.47 cm ය. 5.48 cm ය.

31.විවිධ අවස්ථාවන්ට අනුකූලව ඇඳුම් පැළඳුම් භාවිතය පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ

1. රැකියාවකට / සම්මුඛ පරීක්ෂණයකට යාමේදී කාන්තාවකට ඔසරිය හෝ සාරිය වඩාත් උචිත ය.
2. රැකියාවකට යාමේදී ආභරණ අවම ලෙස පැළඳීම වඩාත් සුදුසු ය.
3. රාත්‍රියේ පවතින මංගල උත්සවවලට සුදු වර්ණය භාවිතය ඉතා සුදුසු ය.
4. පිරිමි පුද්ගලයන් ඉණ පටි හා මේස් පැළඳීමේදී තද වර්ණ භාවිත කිරීම වඩාත් සුදුසු ය.
5. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීමේදී පිරිමි පුද්ගලයන් ලා වර්ණයෙන් යුතු කමිස ඇඳීම ඉතා යෝග්‍යය.

32.සන්නිවේදන මාධ්‍යයක් ලෙස දුරකථනය නිසි ලෙස භාවිතා කිරීමේදී වඩාත් **නිවැරදි** වන්නේ
1. තෙවරක් නාද වීමෙන් පසු දුරකථනයට ප්‍රතිචාර දැක්වීම ය.
2. අනෙකුත් කාර්යන්හි දී නියැලෙමින් සංවාදයට පිළිතුරු දීම ය.
3. අනෙක්පස සිටින පුද්ගලයා අභිබවමින් සංවාදයේ නියැලීම ය.
4. අනෙක්පස සිටින පුද්ගලයාට දිගුවේලාවක් කරුණු පැහැදිලි කිරීම ය.
5. නිවැරදි ආචාර කිරීමෙන් පසු දුරකථන සංවාදයට පිවිසීම ය.

33.විවේක ක්‍රියාකාරකම් පිළිබඳ දක්වා ඇති තොරතුරු අතරින් අදාළ **නොවන** ප්‍රකාශය වනුයේ
1. විවේකය, ක්‍රියාශීලී හා ක්‍රියාශීලී නොවන ලෙස වර්ග වේ.
2. සමාජීය විවේකය, ක්‍රියාශීලී නොවන විවේකයේම කොටසක් වේ.
3. ක්‍රියාශීලී විවේක ක්‍රියාකාරකම් මගින් කායික හා මානසික සෞඛ්‍ය වර්ධනය වේ.
4. ක්‍රියාශීලී නොවන ක්‍රියාකාරකම් සඳහා අඩු ආයාසයක් යෙදෙ වේ.
5. ක්‍රියාශීලී සහ ක්‍රියාශීලී නොවන ක්‍රියාකාරකම් සඳහා යොදන කාලය සමතුලිත විය යුතු වේ.

34.පහත දක්වා ඇත්තේ ප්‍රතිමෝදන ක්‍රියාකාරකම් කීපයකි.

A. විනෝදය සඳහා රිය පැදවීම
B. රට තුළ කෙටි චාරිකාවල නිරත වීම
C. භෝජන ශාලාවක දී ආහාර ගැනීම
D. යහළුවන් හා නෑදෑයන් වෙත යාම

ඉහත ක්‍රියාකාරකම් අතරින් උසස් සමාජ සන්තුෂ්ටිය අරමුණු කරගත් ක්‍රියාකාරකම් වනුයේ,

1.A සහ B ය. 2.A සහ C ය. 3.B සහ C ය.
4.A සහ D ය. 5. C සහ D ය.

35.සලකා බලන රටෙහි ආර්ථික බල ප්‍රදේශය තුළ නේවාසිකව සිටින පුද්ගලයන් එම රටෙන් පිටතට ආගන්තුකයන් ලෙස සිදුකරන සංචරණය වන්නේ,

1.අභ්‍යන්තර යොමුගත සංචරණය යි. 2.බාහිර යොමුගත සංචරණය යි
3.දේශීය සංචරණය යි. 4.ජාතික සංචරණය යි.
5.කලාපාන්තර සංචරණය යි.

36.සංචරණයෙහි යෙදීමෙන් පුද්ගලයාට අත්වන ප්‍රතිලාභයක් වන්නේ
1. ඍජු හා වක්‍ර රැකියා අවස්ථා උදාවීම ය.
2. රජයට අමතර බදු ආදායමක් ලබාදීම ය.
3. ධනාත්මක ස්වයං ප්‍රතිරූප වර්ධනය කර ගැනීමට හැකිවීම ය.
4. සංස්කෘතික උත්සව සංරක්ෂණය කිරීමට උදව්වීම ය.
5. ශක්තිමත් සමාජ කණ්ඩායමක් ගොඩනැගීම ය.

37.ජල නළ සවිකිරීමේදී සමාන කෙවෙණිය (plain socket) හා ඌණිත කෙවෙණිය ((Reducing socket) පිළිවෙළින් භාවිත කරනුයේ,
1. නළයේ දිශාව වෙනස් කිරීම හා නළයක් අතරට කපාටයක් සවි කිරීමට ය.
2. විශ්කම්භයෙන් අසමාන නළයක් සවිකිරීම හා නළයේ දිශාව වෙනස් කිරීමට ය.
3. නළයක් අතරට කපාටයක් සවි කිරීම හා නළ මාර්ගයට කරාමයක් සවි කිරීමට ය.
4. විශ්කම්භයෙන් සමාන නළ සම්බන්ධ කිරීම හා විශ්කම්භයෙන් අසමාන නළ සම්බන්ධ කිරීමට ය.
5. විශ්කම්භයෙන් අසමාන නළ සම්බන්ධ කිරීම හා නළයේ දිශාව වෙනස් කිරීම ය.

38.ජලයේ යෝග්‍යතාව මැන බැලීම සඳහා කරනු ලබන පරීක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. ජලයේ PH අගය මැනීම
B. ජලයේ උෂ්ණත්වය මැනීම
C. ජීව විද්‍යාත්මක ඔක්සිජන් ඉල්ලුම මැනීම
D. ජලයේ අඩංගු ක්ෂුද්‍රජීවීන් ප්‍රමාණය මැන බැලීම
E. ජලයේ අඩංගු කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය මැන බැලීම

ඉහත පරීක්ෂණ අතරින් භෞතික පරීක්ෂණයක් හා ජීව විද්‍යාත්මක පරීක්ෂණයක් ඇතුලත් වරණය වනුයේ,

1.A සහ C ය. 2. C සහ D ය. 3. B සහ D ය
4.D සහ E ය. 5. A සහ E ය.

39.පහත දක්වා ඇති වරණ අතරින් විද්‍යුත් ශක්තිය , තාප ශක්තිය බවටත් විද්‍යුත් ශක්තිය චාලක ශක්තිය බවටත් පත් කරන උපකරණ පිළිවෙලින් දක්වා ඇත්තේ,

1. විදුලි උදුන සහ ක්ෂුද්‍ර තරංග උදුන ය. 2.ස්ත්‍රික්කය හා බත් පිසිනය ය.
3. බත් පිසිනය හා විදුලි පෝරනුව ය. 4.බ්ලෙන්ඩරය හා ශීතකරණය ය
5. බත් පිසිනය හා බ්ලෙන්ඩරය ය

40.පහත දැක්වෙන විදුලි උපකරණවල විද්‍යුත් ක්ෂමතාව වැයවන ආකාරය,අවරෝහණය වන ලෙස දක්වා ඇති පිළිතුර වන්නේ,

1. විදුලි ස්ත්‍රික්කය, CFL විදුලි පහන් සහ රූපවාහිනිය ය.
2. විදුලි ස්ත්‍රික්කය, රූපවාහිනිය සහ LED විදුලි පහන් ය.
3. LED විදුලි පහන්, විදුලි ස්ත්‍රික්කය සහ තාප දීප්ත විදුලි පහන් ය.
4. CFL විදුලි පහන්, රූපවාහිනිය සහ විදුලි ස්ත්‍රික්කය ය.
5. තාප දීප්ත විදුලි පහන්, විදුලි ස්ත්‍රික්කය සහ CFL විදුලි පහන් ය.

41.පුනර්ජනනීය සම්පත් පිළිබඳව **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,

1. නැවත නැවත භාවිතයට ගතහැකි ස්වභාවික සම්පතක් වීම
2. මුළුමනින්ම ප්‍රතිස්ථාපනය කළ හැකි හෝ ක්ෂය කළ නොහැකි සම්පතක් වීම
3. නැවත ජනනය වීමේ හැකියාවක් නොමැති හෝ ඉතා අවම ජනනය වීමේ හැකියාවක් ඇති සම්පතක් වීම
4. භාවිතා කරන වේගයට වඩා වැඩි වේගයෙන් ජනනය වීමට හැකියාවක් ඇති සම්පතක් වීම
5. ස්වාභාවිකව ජනනය වීමේ හැකියාවක් තිබීම

42. අපද්‍රව්‍ය වර්ගීකරණයේ දී උපද්‍රවකාරී **නොවන** අපද්‍රව්‍යයක් වන්නේ

1.සෞඛ්‍ය සේවා අපද්‍රව්‍ය ය. 2.කාර්මික අපද්‍රව්‍ය ය. 3.රසායනික අපද්‍රව්‍ය ය.
4.කෘෂිකාර්මික අපද්‍රව්‍ය ය. 5.විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය ය.

43. ආහාර ද්‍රව්‍යවල ඇති, එහි ක්‍රියාකාරීත්වයට දායක වන ජෛව ක්‍රියාකාරී සංඝටක පිළිබඳ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A. ප්‍රතිශක්තිකරණ පද්ධතිය ශක්තිමත් කරයි.
B. ආහාර ජීර්ණ පද්ධතියේ හානිදායක බැක්ටීරියා වර්ධනය වළක්වයි.
C. පිළිකා හා මානසික ආතතිය අඩු කරයි.
D. ක්ෂුද්‍රජීවී සමතුලිතතාව ඇති කරයි.

ඉහත කරුණු අනුව ප්‍රෝබයෝටික් පිළිබඳව නිවැරදිව තොරතුරු දක්වා ඇති කරුණු වන්නේ,

1.A සහ B ය. 2. A සහ C ය. 3. A සහ D ය.
4. C සහ D ය. 5. B සහ D ය.

44.ආහාර පිසීමේදී පිටවන විමෝචන අඩුකිරීමට ගතහැකි ක්‍රියාමාර්ගයක් **නොවන්නේ,**

1. ගෑස් උඳුනේ නිල් දැල්ල භාවිත කිරීම
2. ආහාර පිසීමේදී පියන ඇර පිසීම
3. ආහාර පිසීමේදී අවශ්‍ය ප්‍රමාණයට පමණක් ජලය යෙදීම
4. විශාල භාජනවල ආහාර නොපිසීම
5. ගෑස් උඳුන්වල පිසීමේදී විශේෂිත මැටි භාජන භාවිත කිරීම

45.මානසික පීඩනය පෙන්නුම් කරන චිත්තවේගී ලක්ෂණයකි.

1.කනස්සල්ල 2.අලසබව 3.කලබල වීම
4.ආහාර අරුචිය 5.තීරණ ගැනීමට නොහැකි වීම

46.නව යොවුන් අවධියේ සංවර්ධනය පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය කුමක්ද?

1. කායික වර්ධනය වේගයෙන් සිදු වේ.
2. බුද්ධිමය වර්ධනය වේගයෙන් සිදු වේ.
3. චිත්තවේගික වර්ධනය වේගයෙන් සිදු වේ.
4. ලිංගික වශයෙන් පරිණත වේ.
5. ස්ව සංකල්ප ගොඩනගා ගැනීමට අකමැති වේ.

47.පුද්ගලයකුගේ පෞරුෂය කෙරෙහි ප්‍රබල ලෙස බලපාන බාහිර සාධක වන්නේ,

1.පවුල සහ පාසල ය. 2. හමේ වර්ණය සහ පෙනුම ය. 3. පෙනුම සහ පවුල ය.
4.කථන හැකියාව සහ පාසල ය. 5. හීනමානය සහ අධිමානය ය.

48.දරුවන් තුළින් පිළිබිඹුවන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A. තර්ක කිරීමට පෙළඹේ.
B. සැමවිටම දෙමාපියන් අනුගමනය කරයි.
C. හුදකලා වීමට ප්‍රිය කරයි.
D. නවීන විලාසිතා අනුගමනය කරයි.

ඉහත ලක්ෂණ අතරින් යොවුන්වියට සුවිශේෂී වූ ලක්ෂණ වනුයේ

1.A සහ B ය. 2. A සහ D ය. 3. B සහ C ය.
4.D සහ C ය. 5.A සහ C ය.

49.ව්‍යාපාරයක නිෂ්පාදනවල තත්ත්ව පාලනයේදී ලබා දෙන ඉහළ තත්ත්ව සහතික වනුයේ,

1. CIMP සහ HACCP ය.
2. SLS සහ GMP ය.
3. GMP , ISO සහ SLS ය.
4. SLS , ISO සහ HACCP ය.
5. HACCP , GMP සහ ISO ය.

50.පංචවිධ සංකල්පය පිළිවෙලින් දක්වා ඇති වරණය වන්නේ

1. පිළියෙල කිරීම, පිරිසිදු කිරීම, තේරීම, සම්මතකරණය, පුහුණුව සහ ශික්ෂණය යි.
2. තේරීම, පිළියෙල කිරීම,පිරිසිදු කිරීම, සම්මත කරණය, පුහුණුව සහ ශික්ෂණය යි.
3. සම්මතකරණය, තේරීම, පුහුණුව, පිළියෙල කිරීම, ශික්ෂණය සහ පිරිසිදු කිරීම යි.
4. පුහුණුව, සම්මතකරණය, පිළියෙල කිරීම, තේරීම, ශික්ෂණය සහ පිරිසිදු කිරීම යි.
5. පිරිසිදු කිරීම , තේරීම , පිළියෙල කිරීම, සම්මතකරණය, ශික්ෂණය සහ පුහුණුව යි.